**සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් උදෙසා: අයිතීන්. සමානාත්මතාවය. සවිබල ගැන්වීම.**

**ජාත්‍යයන්තර කාන්තා දිනය 2025**

වසර හතළිහක් පුරාවට ඩාබිඳු සාමූහිකය කාන්තාවන් විශේෂයෙන් නිදහස් වෙළඳ කලාපයේ ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු කාන්තා අයිතිවාසිකම් බලගැන්වීම වෙනුවෙන් පෙනී සිටින අතර ඔවුන් සමාජයට සහ ආර්ථිකයට ලබා දෙන අත්‍යවශ්‍ය දායකත්වය හඳුනා ගනිමින් ඔවුන් උදෙසා ඔවුන් හා එක්ව සටන් කරන්නෙමු. පුරුෂ මූලික සමාජයක් තුළ වෙසෙන කාන්තාවෝ හුදෙක් පැවැත්ම ඉක්මවා ගොස් තීරණ ගැනීමේ දී සක්‍රීය දායකත්වයක් ලබා දිය යුතු අතර මේ සඳහා බල අසමතුලිතතා ආමන්ත්‍රණය කරමින් කාන්තා හඬ යථාර්තයක් කළ යුතුයි.

කාන්තාවන් ආර්ථික බල ගැන්වීම, ඔවුන්ගේ සමස්ත යහපැවැත්මට සහ සමාජයට සම්පූර්ණයෙන්ම සහභාගී වීම් හැකියාවට මූලික වේ. 2025 වන විට ලංකාවේ රාජ්‍ය සහ ආණ්ඩු මට්ටමින් කාන්තාවන්ගේ නියෝජනය ඉතාමත් ඉහළ අගයත් ගන්නා බව අපි හොඳාකාරවම දනිමු. ඉන් නොනැවති ගෝලීය සැපයුම් දාමයන් තුළ කාන්තාවන්ගේ සක්‍රීයත්වය තවදුරටත් වැදගත් වේ. ඒ අනුව කාන්තාවන් බල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර රාමු සහ හවුල්කාරීත්වය තවදුරටත් ශක්තිමත් විය යුතුයි.

ඒ ඔස්සේ කාන්තා අයිතිවාසිකම්වලට ගරු කරන, කාන්තාවන්ගේ සාමූහික බලය සහ ඔවුන්ගේ දායකත්වයන් සෑම මට්ටමකින්ම අගය කරන ලෝකයක් නිර්මාණය කිරීම සඳහා අප කැප වී සිටිමු. මෙම කාන්තා දිනයේදී, ජාතිය, කුලය යනාදී සකලවිධ අනන්‍යතාවන් හේතුවෙන් අප අතර පවතින අසමානතා අනුදැක ඊට එරෙහිව සටන් කිරීමට අපි එක් වෙමු. කාන්තාවන් අත්හැර දමා ඇති ගෝලීය නව ලිබරල් පාලනාධිකාරියෙන් ඔබ්බට අරගල කිරීමටත් අදිටන් කරගනිමින් පහත අවස්ථා ගොඩනගන ලෙස අපි බල කර සිටිමු.

**1 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) C190 ප්‍රතිපත්තිය සම්මත කිරීම.**

ILO සම්මුතිය C190 (ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර සම්මුතිය) රැකියා ලෝකයේ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර තුරන් කිරීම සඳහා රාමුවක් සපයයි. එය සම්මත කිරීම සේවක ආරක්ෂාව සඳහා ශක්තිමත් කැපවීමක් පෙන්නුම් කරයි. 2025 ජිනීවාහි පැවති CEDAW සමුළුවර (කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය) සහභාගී වෙමින් ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රකාශ කර සිටියේ මෙය සම්මත කිරීමට රජය සූදානම් බවයි. කාන්තාවන්ට සහ LGBTQ+ පුද්ගලයින්ට සේවා ස්ථාන හිරිහැර කිරීම් නැවැත්වීම සහ මැඩපැවැත්වීම සඳහා C190 අනුමත කිරීම පිළිබඳ රජය ලබා දුන් පොරොන්දු ඉටු කරන ලෙස අපි බලකර සිටිමු.

**2 රැකියා ස්ථානයේ හිංසන විරෝධී නීතියක් හඳුන්වා දීම.**

ශ්‍රී ලංකාවේ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂක නීති මගින් සේවා ස්ථානයේ සිදු වන හිරිහැර ආවරණය නොවේ. C190 අනුමත කිරීම පමණක් නොව, කාන්තා වෘත්තීය සමිතියක් ලෙස අපගේ අභිප්‍රාය වන්නේ රැකියා ස්ථානයේ හිංසන විරෝධී නීතියක් බලාත්මක කර ක්‍රියාත්මක කිරීමෙන් කාන්තාවන්ට සහ LGBTQ+ පුද්ගලයින්ට ආරක්ෂිත සහ ගෞරවනීය සේවා පරිසරයක් භුක්ති විඳීමේ අවකාශය ගොඩනගන ලෙස අපි බල කර සිටිමු.



No. 221, Welaboda Road, Katunayake, Sri Lanka.
Tel: +94 11 4 851 383 | Email: dabindu.infoco@gmail.com | Web: www.dabinducollective.org | Registration No - 9194

**3 පැය 24 පුරා ළමා හා කාන්තා කාර්යංශ නිදහස් වෙළඳ කලාප තුළ ඉදිකළ කිරීම.**

ප්‍රචණ්ඩත්වය අත්විඳින කාන්තාවන් සඳහා පොලිස් ස්ථානවලට විශේෂිත සහාය ලබා දෙන කැපවූ කාන්තා කර්යංශයක් පැය 24 පුරා නිදහස් වෙළඳ කලාප තුළ ස්ථාපනය කළ යුතු බව කාන්තා වෘත්තීය සමිතියක් ලෙස අපගේ ස්ථාවරය අපි අවධාරණය කර සිටිමු.

**4 සූරාකෑමට සහ වහල්භාවයට ඉඩ සලසන පීඩිත ඒකීය කම්කරු නීති නව රජය ඉවත් කළ යුතුය.**

**5 කාන්තාවන්ගේ වෘත්තීය සමිතිගත වීමේ සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය තහවුරු කිරීම.**

ආර්ථික අර්බුධයක් මධ්‍යයේ, තේ වතු, ඇඟලුම් සහ ගෘහස්ථ සේවය යන රටට විදේශ විනිමය ගෙනෙන සෑම ක්ෂේත්‍රයකම කාන්තාවන් රැකියාවේ නියුතු වුව ද මෙම ක්‍රියාවන් උදෙසා සංවිධානය වීමට හෝ වෘත්තීය සමිති ගොඩනැගීමේ දී කාන්තාවන් බොහෝ හිංසනයන්ට ගොදුරු වේ. එහිලා මූලිකත්වය ගෙන කටයුතු කිරීමට කාන්තාවන්ට ඉඩ වෙන් විය යුතුය.

සේවායෝජකයින්ට සේවකයින්ගේ වෘත්තීය සමිති සාමාජිකත්වය හෝ ක්‍රියාකාරකම් පදනම් කරගෙන ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම නීතිය පැහැදිලිවම සටහන් වුවත්, යථාර්තය වනුයේ සේවායෝජකයින් සේවිකාවන්ට වෘත්තීය සමිතිගතට වීම සහ ඔවුන්ගේ සාමූහික බලය භාවිතා කිරීමට එරෙහිව බිය ගන්වයි. වෘත්තීය සමිතිගත වීමටත් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් අපි කම්කරු අමාත්‍යාංශයෙන් සහ කම්කරු දෙපාර්තුමේන්තුවන් ඉල්ලා සිටිමු.

**6 කාන්තාවන්ගේ මූලික අවශ්‍යතාවක්ක් ලෙස සනීපාරක්ෂක තුවා නොමිලේ ලබා දීම.**

වර්තමානයේ පාසල් තුළ ක්‍රියාත්මක වන සනීපාරක්ෂක තුවා වවුචර් ක්‍රමය වෙනුවට සනීපාරක්ෂක තුවා සපයන ලෙසත් එය අඩු ආදායම්ලාභී පවුල් වල ඉගෙනුම ලබන ගැහැණු දරුවන්ට පමණක් සීමා නොවී සමස්ත පාසල් පද්ධතිය තුළම සිටින ගැහැණු දරුවන්ට පාසල තුළින්ම ලබා දීමට කටයුතු කළ යුතුයි.

රැකියා ස්ථානයේ ඔසප් සනීපාරක්ෂාවේ වැදගත්කම පිළිගැනීමක් වශයෙන් ඇඟලුම් කම්හල්වල සේවිකාවන්ට දවසකට රු. 20-40ක මුදලකට මිල දී ගත යුතු සනීපාරක්ෂක තුවා සැපයුම් ක්‍රමය වෙනුවට, කර්මාන්තශාලාවල පැය 9යේ වැඩ මුරයට තුවා 2ක් නොමිලේ ලබා දීම අනිවාර්ය කළ යුතුය.

**7 සනීපාරක්ෂක තුවා බදු අහෝසි කිරීම.**

සනීපාරක්ෂක තුවා මත යොදා ඇති බදු ඉවත් කිරීම සහ සහනාධාර මිල ගණන් ලබා දීම මඟින් සනීපාරක්ෂක නිෂ්පාදන වඩාත් දැරිය හැකි මිලකට ලබා දිය යුතුය.

**8 ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ රජය විසින් පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සායන වැඩසටහන් වැඩි දියුණු කිරීම.**

නිදහස් වෙළඳ කලාපය තුළ වෛද්‍ය සෞඛ්‍ය කාර්යාලය ස්ථාපිත කර තිබුණද, කාන්තාවන් සහ LGBTQ+ පුද්ගලයින් එහි සේවාවන් ලබා ගැනීමට වෙලාවක් නැත. සේවිකාවන්ට ඔවුන්ගේ ගමේ/නගරයේ ඇති ඵධ්‍ය සායනයට පැමිණීමට නොහැකි වන්නේ ඔවුන්ගේ එකම නිවාඩු දිනය ඉරිදා බැවිනි. එනිසා ගර්භනී සහ කිරි දෙන කාන්තාවන්ගේ පෝෂණයට සහ කාන්තාවන්ගේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යයට අහිතකර බලපෑමකි. ඒ සේවිකාවන් වෙනුවෙන් සති අන්තයේ එක් දිනයක් හෝ මහජන සෞඛ්‍ය කාර්යාලයේ සේවාවන් ලබා ගැනීම සඳහා ඉඩ සැලසිය යුතුය.

**9 වැටුප් රහිත සුරුකුම් වැඩ සඳහා ආධාරක ව්‍යුහයන් ශක්තිමත් කිරීම.**

කර්මාන්තශාලා සහ සේවා ස්ථානවල දිවා සුරැකුම් පහසුකම් ස්ථාපිත කිරීම වැඩ කරන මව්වරුන්ට සහාය වේ. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වැඩිහිටි නිවාස සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන් වෙනුවෙන් ආරක්ෂිත නිවාස සඳහා වැඩි අරමුදල් වෙන් කිරීම සඳහා 2026 අයවැය තුළින් වැඩි මුදලක් වෙන් කරන ලෙස අපි ඉල්ලා සිටිමු.

**10 සුරැකුම් වැඩ වල දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයේ අගය කිරීම**

කාන්තා ශ්‍රමය නිවෙස් තුළත් අවිධිමත් අංශය තුළත් බොහෝ විට ආන්තිකරණයට ලක් වූ ශ්‍රමය දක්වා විහිදේ. දළ දේශීය නිෂ්පාදිතයට සුරැකුම් වැඩවල දායකත්වය ඇතුළත් කිරීම සුරැකුම් වැඩ පරිසරයන්හි ආර්ථික වටිනාකම පෙන්වීමට උපකාරී වේ. එය ඇගයීම උදෙසා සුරැකුම් වැඩ වල දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයෙත්, කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වයේත් සඳහා එක් කළ යුතුය.

**11 පැය 8 ක වැඩ දිනයක් සඳහා සරිලන ජීවන වැටුපක්.**

**12 IMF මෙහෙයවන වැට් බදු සහ විදුලිය/ගෑස් මිල ඉහළ නැංවීම් ඇතුළු කප්පාදු පියවර නැවැත්වීම.**

**13 ජාත්‍යන්තර බැඳුම්කර හිමියන්ගෙන් ණය කප්පාදු කිරීම සහ අර්ථසාධක අරමුදල් ආරක්ෂා කිරීම**

කාන්තා සංවිධානයක් සහ වෘත්තීය සමිතියක් ලෙස 2025 ජාත්‍යන්තර කාන්තා දිනය සමරන අපි අවධාරණය කරන්නේ කම්හල්, වතු, ගොවිබිම් සහ මුහුදුවලත් එහි සීමාවන් ඉක්මවාත් යන කාන්තා ශ්‍රමයට ගරුත්වය, ආරක්ෂාව, අයිතීන්, සමානාත්මතාවය, සවිබල ගැන්වීම.



No. 221, Welaboda Road, Katunayake, Sri Lanka.
Tel: +94 11 4 851 383 | Email: dabindu.infoco@gmail.com | Web: www.dabinducollective.org | Registration No - 9194